# ජාත්‍යන්තර කාන්තා දිනය

# International Women's Day



**World's first woman Prime Minister, Mrs Sirima Bandaranayake of Sri Lanka in 1960 - the day she assumed duties as country's Premier.**

***ලොව ප්‍රථම අගමැතිනිය වන සිරිමා බණ්ඩාරනායක මැතිනිය 1960 දී අගමැති ධූරයට පත් වූ දිනයේ සිය කාර්යාලයේදී ගත් ඡායාරූපයකි මේ.***

**ගි**ය අවුරුද්දේ ලෝක කාන්තා දිනය වෙනුවෙන් ඇමරිකාවේ සුප්‍රකට ටයිම් සඟරාවේ ලෝකයේ රටවල දේශපාලනික නායකත්වය දැරූ ප්‍රබල කාන්තාවන් **8** දෙනෙකු ගැන ඡායාරූප සහිතව විස්තර පළකොට තිබුණි. ඉන්දියාවේ ඉන්දිරා ගාන්ධි, බ්‍රිතාන්‍යයේ මාර්ග්‍රට් තැචර්, ශ්‍රීලංකාවේ සිරිමාවෝ බණ්ඩාරනායක, පකිස්ථානයේ බෙනාසීර් භූතෝ, පිලිපීනයේ කොරසොන් ඇක්වීනෝ, ජර්මණියේ ඇන්ජලා මර්කල්, ලයිබීරියාවේ එලන් ජොන්සන් සහ ඊශ්‍රායලයේ ගෝල්ඩා මේයර් ඒ අට දෙනා වෙති.

මෙකී කාන්තාවන් අට දෙනා අගමැති හෝ ජනාධිපතිවශයෙන් හෝ නායකත්වයට පත්වූ ඒ ඒ රටවල ප්‍රථම කාන්තාවෝ වෙති. එයිනුදු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියට විශේෂ තැනක් හිමිවන්නේ ඇය ශ්‍රීලංකාවේ ප්‍රථම අගමැතිණිය වූවා පමණක් නොව වර්තමාන ලෝකයේ කිසියම් රටක නායකත්වයට පත් ප්‍රථම ගැහැණියද වන බැවිනි. ඉහත ලැයිස්තුවේ සිටින අන් සියල්ලන් කරළියට ආවේ බණ්ඩාරනායක මැතිණියට පසුව ය. ඇයගේ දේශපාලනික ජයග්‍රහණය හා නායකත්වයට පත්වීම පිළිබඳ පණිවුඩය මුළු ලොව පුරා හමා ගියේ සුළඟක් පරිද්දෙනි. එය ලෝකයේ වනිතා සංහතියටම ජීවය පිඹීමක් වූයේය. අප රටේ පමණක් නොව ලොව පුරා කාන්තාවෝ වඩ වඩාත් ධෛර්යමත් වූහ. තොට්ල්ල පදවන අත ලොව ආණ්ඩු කරයි යන පැරණි කියමන සැබෑවක්ම වූයේය.

බණ්ඩාරනායක මහත්මියගේ පාලන සමයේ රටට සමාජයට වැඩදායක බොහෝ දේ සිදුවීය. එසේම ඉතිහාසයේ ඇය තැබූ සලකුණ වනිතා ජයග්‍රහණය පිළිබඳ පැහැදිලි ප්‍රබලම සාක්ෂියයි.

Last year, on the Women's Day, New York's TIME magazine published an article depicting number of prominent ladies who took leadership and centre-stage in world politics. Among them were:

Indira Gandhi - **India**, Margaret Thatcher - **UK**, Sirima Bandara naike - **Sri Lanka**, Benazir Bhutto - **Pakistan**, Corazon Aqu ino - **Philippines,** Angela Merkel **Germany,** Ellen Johnson Sirleaf - **Liberia** and Golda Meir of **Israel.**

**This is what the TIME magazine had written about Sri Lanka's Mrs Bandaranaike:**

" The World First Lady prime minister, Fifty years ago Shirimavo Bandaranaike became the first woman in the foreseeable history - the head of government. Her victory is so overwhelmed by all that no one knew how to correctly call. " We need to invent a new word "- wrote the London Evening News the next day after Shirimavo elected Prime Minister of Ceylon (then called Sri Lanka). " What's her name ? Shrima, meaning Regent ? "

Mrs Bandaranaike led the party after the death of her husband, who was slain by a Buddhist monk in 1959. After winning her party in 1960, she took the reins in his hands and rules until 1965. After that she became prime minister twice - from 1970 to 1977 and from 1994 to 2000. Her daughter was the first-ever woman president in 1994, she appointed her mother prime minister for the last time (it should be noted that this appointment was rather a tribute of respect).

Shirimavo resigned in April 2000 and died in the same year."

# ඇත්ත කෙටි කතාව කාපට් ක්ලීනර්

**මේ** දැනට අවුරුදු 26 කට විතර කලින් අපි එංගලන්තෙට ආපු මුල් අවධියෙ වෙච්ච සිද්ධියක්. අපි එංගලන්තෙට පෙබරවාරි මාසෙ ඇවිත් දවස් දෙක තුනකින් හිම වැටුණා දනිස් ගාවට. ඒ දවස්වල දැන් වගේ ලංකාවෙන් මෙහාට ගේන්න හොඳ හිම කබා තිබුණෙ නැහැ. මොරටුවෙ වෙලෝනා එක විතරයි ඇඳුම් හදන තැන කට තිබුණෙ. එතනට ගිහිල්ලා තිබුණු කබා දෙක තුනෙන් අළුපාට එකක් තෝරලා ගත්තා. හරියට හඳට යන්න අඳින ජාතියෙ එකක් වගේ. අපි හිතුවෙ ඒවා ඒ කාලෙ එංගලන්තෙ පැෂන් වෙන්න ඇති කියලා. මෙහේදි ඒවා ඇඳගෙන යනකොට සුද්දො අපි එක්ක හිනාවුණා. පස්සෙ තමයි තේරුණේ ඒ හිනාවෙලා තියෙන්නෙ අපේ හිම කබායට කියලා. කිවයුතු අනික් කාරණේ තමයි මෙහේ හීතලට ඒ අපි ලංකාවෙන් ගේන කබා ඔරොත්තු දෙන්නෙ නැහැ.

කොහොම හරි විභාගෙත් කරලා ඉවරවෙලා ප්‍රතිඵල එනකල් කරන්න රස්සාවක් හොයන්න පාරට බැස්සා. දවසේ කෝච්චි පාස් එකක් අරගෙන වික්ටෝරියා ලයින් එකේ හැම ස්ටේෂන් එකකම බැහැලා, එළියට ගිහිං ඒ අවට කඩ සාප්පුවල, සුපර්මාකට් වල, ආපන ශාලා වල කරන්න වැඩක් බැලුවා. පිහන් හෝදන්න හරි ලෑස්ති වෙලා හිටි මට කීප තැනකින්ම වැඩ ඇහුවට හම්බවුණේ නැහැ. එක තැනක අයිතිකාරයෙක් ඇහුවා, " උඹට මොනවද කරන්න පුළුවන් ? " කියලා මම කිව්වා, ඕන දෙයක් පුළුවන් කියලා. එතකොට මිනිහ කියපි, " ඕන දේකට රස්සාවල් අපි ළඟ නැහැ....." කියලා. ඉතින් මම දැනගත්තා මොකක් හරි එක දෙයක් පුළුවන් කියලා කියන්න ඕන කියලා.



කොහොම හරි කිංස්ක්‍රොස් වල ඉන්දියන් රෙස්ටුරන්ට් එකක වැඩ ඉල්ලන්න ගියා. එතන අයිතිකාරයා ක්‍රිකට් පිස්සෙක් ලංකාවෙ ක්‍රිකට් ගැන මගෙන් අහන්න පටන් ගත්තා. ඉන්දියන් පිල ගැන මොකද හිතන්නෙ ඇහුවා. මම සුනිල් ගවස්කර්ගේ බැටිං ගැන වර්ණනා කළා. මගේ කාමරේ ඇඳට උඩින් ගවස්කර්ගේ ලොකු පෝස්ටර් එකක් ගහං ඉන්නවයි කිව්වා. ඒක අලි කෙප්පයකි. මේවයින් මිනිහට මාව හිතට ඇල්លුවා. කිව්වා එදා ඉඳලා වැඩකරන්න කියලා. ඉතින් වැඩ පටන්ගත්තු ගමන් මැන් මට මුල්ලක තිබුණු කාපට් පිරිසිදු කරන හූවර් එක පෙන්නලා " කැන් මේක් ද හූවර් .....? " කියලා ඇහුවා. මට තේරිච්ච හැටියට, ඒ ඇහුවෙ උඹට හූවර් එක හදන්න පුළුවන්ද කියලා නේ. මං හිතන්නෙ හූවර් එක කැඩිලා ඇති, එයා හිතන්නත් ඇති මට මැකැනික් වැඩත් පුළුවන් කියලා. මම ඔළුව වැනුවා. (ඒ කාලෙ ලංකාවෙන් ආපු හැම කෙනෙක්ම ප්‍රශ්නයක් ඇහුවම පුළුවන්ද බැරිද කියන්නෙ වචනෙන් නෙවෙයි, ඔළුව වනලා. ඒ කාලෙ විතරක් නෙවෙයි දැනුත් අපේ අය එහෙමයි.) අපි ලංකාවෙදි හූවර් ගැන දන්නෙ නෑනේ. ඒ කාලෙ ලංකාවෙ ගෙවල් වල බිම පොලිෂ් කරන හූවර් එකට සමාන ඒවා තිබුණා. ඒවා සමහර වෙලාවට වැඩ කරන්නෙ නැතුව ගියාම, ප්ලග් එක ගලවලා, අළුත් පියුස් එකක් දැම්මම හරි. මමත් දන්න මැකැනික් වැඩේ එච්චර තමයි. මම මේ හූවර් යන්තරේ ගැන හිතුවෙත් එහෙමයි. ඉතින් මම දන්න මිනිහා වගේ ගිහිල්ලා හූවර් එකේ ප්ලග් එක අරන් එතන බිත්තියෙ සොකට් එකට ගහලා ස්විච් එක දැම්මා බලන්න. මෙන්න බොලේ, ඒක බූං ගාලා ස්ටාර්ට් වුණා. මම දුවලා ගිහිං අයිතිකාරයට කිව්වා හූවර් එක කැඩිලා නැහැ, අන්න ඒක හොඳට වැඩකරනවා කියලා. මිනිහා මගේ දිහා බලලා, පල් හිනාවක් දාලා කිව්වා, " මම දන්නවා ඒක කැඩිලා නැති බව, ඒක අරගෙන මෙන්න මෙහෙම ඒ කාපට් සේරම ටික වැකුම් කරපං " කියලා අත හොලවලා මට පෙන්නුවා.

කවද කාපු ටකරං ද ? ඉතින් මම පුරා පැය තුනක් ඒ මුළු රෙස්ටුරන්ට් එකම හූවර් කළා.

**නීතිඥ අනුර හෑගොඩ**



# බටහිර කරන මහා බොරුව



***2004 වසරේ දී එවකට බ්‍රිතාන්‍යයේ අගමැතිව සිටි ටෝනි බ්ලෙයාර් ලිබියාවට ගොස් එහි නායක කර්නල් ගඩාෆි හමුවූ උණුසුම් හා සුහද අවස්ථාවයි මේ.***

**බ**ටහිර කියලා කිව්වම රටවල් ගොඩක් තිබුණත් එතෙන්දි විශේෂයෙන් අවධාරණය කරන්නෙ ඇමරිකාව සහ බ්‍රිතාන්‍ය ඇතුලු යුරෝපීය රටවල් කීපයක් ගැනයි. අද ලෝකයේ බිහිවෙලා තියන අළුත් යටත් විජිතවාදයේ මුල් තැන අරගෙන කටයුතු කරන්නෙ ඒගොල්ලොයි. ඉංග්‍රීසියෙන් කියන New World Order යනුවෙන් හඳුන්වන, ලෝකය අළුත් පිළිවෙලකට හැඩගස්සන්න මහන්සි ගන්න හාදයො ටිකක් තමයි මේ රටවල නායකයො හැටියට ඉන්නෙ. ඒ ගොල්ල හිතන්නෙ දැන් ලෝකෙ යන හැටි හරි නැහැ, ඒක නිසා හරි ට්‍රැක් එකකට, පාරකට ලෝකෙ දාන එක ඒ අයගෙ වගකීමක් කියලා. කවුරුවත් මේ අයට මුලැදෑනිකම නුදුන්නට, ඒඅය දැනටම මුලැදෑනිකම අරගෙන ලෝකෙ අනෙක් රටවල් ඈත ඉඳන් පාලනය කරන්න ලෑස්ති වෙනවා.

මේ ක්‍රියා පටිපාටිය ඇතුළත මේ බටහිර රටවල මූලික පරමාර්ථය තම තමන්ගෙ රටවල ආර්ථික තත්වය ශක්තිමත් කරගන්න. ඒ එක්කම තමන්ගෙ රටවල් වල නිශ්පාදනය කරන භාණ්ඩ සේරම ලෝකෙ දිළිඳු රටවල වෙළඳ පොලවල් අල්ලගෙන, ඒ හැම දෙයක්ම ඒ රටවලට පුරුදු කරලා, දිළිඳු රටවල් එක්තරා වහල් භාවයකට ගේන්න. විශ්ව ගම්මානය කියන සංකල්පය මුලින්ම ගෙනාවෙ ඒ අය. ඒ අනුව කරන ප්‍රචාරක වැඩ වලින් දිළිඳු රටවල මොළය සෝදලා අළුත් දේවල් පුරුදු කරනවා. එතකොට නොකඩවා තමන්ගෙ රටවලට මුදල් එනවා.

ආයුධ නිශ්පාදනයත් එහෙමයි. ලෝකෙ බොහෝ රටවල අභ්‍යන්තර යුද්ධ කෝලහල තියෙන එක මේ නව ලෝක බලවතුන්ට හොඳ පල්ලමක්. තමන්ගෙ ආයුධ සහ යුද සටන් යාත්‍රා ටික විකුණගන්න. බීබීසී ඇතුළු බටහිර මාධ්‍යය මේ ඇමරිකාව ඇතුළු බටහිර රටවල් ගෙනියන නව ලෝක වැඩ පිළිවෙලට තල්ලුව දෙනවා ඉතා සියුම් විදියට. මේ තත්වය තුන්වන ලෝකය තවම හරිහැටි තේරුම් අරගෙන නැහැ.

ඊළඟට පුංචි රටවල් ස්ව ශක්තියෙන් නැගිටින්න උත්සාහ කරන කොට ඒ රටවල් තම හිතට හරියන තවත් රටවල් සමඟ මිත්‍රකම් පවත්වන වට මේ බටහිර බලවතුන් කැමති නැහැ. අන්න එතෙන්දි තමයි ප්‍රශ්න පටන්ගන්නෙ. හේතුව තමන්ට දැන් තියන අවනත භාවය නැතුව යන හින්ද තමන්ට අනාගතයේදි අකීකරු වේය හිතන හින්දා. ඒ එක්කම ඒ රටවලින් මෙතෙක් ආපු ආර්ථික වාසි නැතිවෙන හින්දා. මෙතෙන්දි මහන්සි ගන්නෙ ඒ රටවල් ඇතුළෙ ඒ ඒ වැසියන් අතර ප්‍රශ්න ඇතිකරලා ඒ රටවල් දෙකට කඩන්න. දැන් මැද පෙරදිග වෙන්නෙ අන්න ඒක තමයි.

ඉරානයෙ ෂා, ඉන්දුනීසියාවෙ ජනාධිපති සුහර්තෝ, පිලිපීනයෙ ජනාධිපති මාකෝස්, පැනමාවල ජනාධිපති නොරියේගා, ඉරාකයෙ ජනාධිපති සදාම් හුසේන්, ඊජිප්තුවෙ හොස්නි මුබාරක් ලිබියාවෙ ගඩාෆි ආදී මේ හිටපු හැම ඒකාධිපතියෙක්ම මුල ඉඳලාම බටහිර රටවල්වල හිතවතුන් හැටියට හිටපු අය. ඔය කියපු රටවල තියෙන ඛණිජ තෙල් ලාබෙට ගන්නා අතරෙ ඒ රටවලට යුද්ධායුද සැපයුවෙ ඇමරිකාව.

2004 දි එවකට බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර් ලිබියා-වට සුහද ගමනක් ගියා. තරහවෙලා හිටපු ගඩාෆි එක්ක ආයි යාළුවුණා විතරක් නෙවෙයි ඒ ගමනේදි ලොකු වෙළඳ ගණුදෙනුවකුත් කළා. බ්‍රිතාන්‍යයට වැඩි කොටස් ප්‍රමාණයක් හිමි ෂෙල් සමාගමට ලිබියාවේ ඛණිජතෙල් ආකරවල තෙල් පිරිසිදු කරන්න ඩොලර් මිලියන 550 ක ගිවිසුමකට අත්සන් කළා.

ගිය සතියෙ ටෙලිවිෂන් එකේ ඇවිත් ගඩාෆිගෙ පුතා කිව්වෙ එංගලන්තයෙ හිටපු අගමැති ටෝනි බ්ලෙයාර් තම පවුලෙ පුද්ගලික හිතවතෙක් බව. ඇයි එහෙම කිව්වෙ? එයින් අපි තේරුම් ගන්න ඕන මොකක්ද? ඒ තමයි බටහිර බලවත් රටවල් කරන බොරුව සහ ඔවුන්ගෙ දෙබිඩි පිළිවෙත.

රටක දූෂිත පාලකයො පන්නලා දාන්න ඒ රටවල ජනතාව පෙළ ගැහෙන අවස්ථාවල මේ බටහිර රටවල් කිට්ටුවෙලා, ජනතාවගෙ පැත්ත අරගෙන ඒ ගොල්ලොත් කෑගහ ජනතාවට සපෝට් එක දෙනවා. අළුතෙන් ඒ රටට හොඳ හෝ නරක හෝ මොකා ආවත් අර බටහිරයොම ඒ අළුත් නායකයා ඉඹලා පිළිගන්නවා. ඔන්න ඕක තමයි පුතේ බටහිර ක්‍රමය.

♦ වෙලේගෙදර රාළ London